# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1636/12 - 2010 ජනවාරි 13 වැනි බදාදා - 2010.01.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කාර්මික ආරවුල් පනත

10 වන වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ නියමය

1957 අංක 14 දරන පනත මගින් සංශෝධිත (131 අධිකාරය වූ ) කාර්මික ආරවුල් පනතේ 10 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න වන මා විසින්, 2009 ඔක්තෝබර් මස 30 දින අංක 1625/26 දරන ගැසට් පත්‍රයේ "2009 අංක 14 දරන සාමුහික ගිවිසුම" යන ශීර්ෂය යටතේ පළකරනු ලැබූවා වූ, 2009 ඔක්තෝබර් මස 16 වැනි දින, ලංකා සේව්‍ය සම්මේලනය සහ ලංකා කම්කරු කොංග්‍රසය, ලංකා ජාතික වතු කම්කරු සංගමය, වතු වෘත්තීය සමිති ඒකාබද්ධ මධ්‍යස්ථානය අතර ඇති කරගත් සාමුහික ගිවිසුම බල නොපවත්වන්නාවූ ද,තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තය හා රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තය සඳහා පඩිපාලක සභා ආඥා පනත යටතේ පිහිටුවන ලද පඩිපාලක සභා මගින් ආවරණය වන්නා වූ ද, සෑම සේවායෝජකයකුම ඉහත කී සාමුහික ගිවිසුමේ සඳහන් කර ඇති නියමයන් සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියමයන් සහ කොන්දේසි 2010 ජනාවාරි 15 දින සිට පිළිපැදිය යුතු බවට මේ මගින් නියම කරමි.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

01-824


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.